# ලිංගිකව සම්ප්‍රේෂණය වන ආසාදනවලින් වළකිමු



NSACP

# ලිංගික ව සම්ප්‍රේෂණය වන ආසාදන යනු

අනාරක්ෂිත ලිංගික ඇසුරක් මගින් ආසාදිත කෙනෙකුගෙන් තවත් කෙනකුට ආසාදනය වන රෝග වේ.




NSACP

# ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග

- හර්පීස් සිම්ප්ලෙක්ස් (**Herpes Simplex**)
- උපදංශය (**Syphilis**)
- ක්ලැමීඩියා (**Chlamydia)**
- සුදු බිංදුම (**Gonorrhea**)
- සුදු බිංදුම නො වන මූත්‍රා ප්‍රදාහය (**Non specific urethritis )**
- ලිංගික ඉන්නන් (**Genital warts**)
- ට්‍රයිකොමොනොයසීස් ආසාදනය
- **HIV/AIDS**

# Sexually Transmitted Infections



# ලිංගික සම්ප්‍රේෂණ රෝගවල ලක්‍ෂණ

- මූත්‍රා මාර්ගයෙන් ස්‍රාව හෝ සැරව පිට වීම.
- මූත්‍රා පහකිරීමේ දී දැවිල්ලක්/වේදනාවක් ඇති වීම.
- යෝනි මාර්ගයෙන් අධික ලෙස ස්‍රාව/සැරව පිට වීම
- ලිංගාශ්‍රිත ප්‍රදේශයේ ඇති වන තුවාල, දිය බිබිළි (උදා:-ශිෂ්නය, යෝනි පෙදෙස හා ගුද මාර්ගය)
- ලිංගික ප්‍රදේශවල හට ගන්නා කැසිල්ල/තුවාල/බිබිළි/ඉන්නන්
- යටිබඩ කැක්කුම
- ලිංගික සම්බන්ධතාවන් හි දී ඇති වන වේදනාව

# ලිංගික ව සම්ප්‍රේෂණය වන රෝගවලින් ඇති වන අහිතකර බලපෑම

- මානසික බලපෑම.
- කාන්තාවන්/පිරිමින් - වඳ භාවය
- ඇතැම් විෂබීජ ගර්භණී කාලයේ දී කලලයට පැතිරීම නිසා නොමේරූ දරුවන් බිහි වීම, මළ දරු උපත් හා අංග විකල දරුවන් බිහි වීම.
- ඇතැම් විෂබීජ ප්‍රසූතියේ දී මවගෙන් දරුවාට පැතිරීම නිසා ඇතැම් විට දරුවන් අන්ධභාවයට පත් විය හැක.
- හෘදය, මොළය, ස්නායු පද්ධතිවලට හානි ඇති විය හැක

# වැදගත් කරුණු කිහිපයක්

- ඇතැම් විට ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග පිටතට රෝග ලක්ෂණ නො පෙන්වයි. නමුත් ශරීරයේ විෂබීජ ඇත.
- මොවුන් සමඟ අනාරක්ෂිත ලිංගික සම්බන්ධතා පවත්වන අයට විෂබීජ ඇතුළු විය හැකිය.
- කෙනෙකුගේ බාහිර පෙනුමෙන් මෙවැනි රෝග නැතැයි අනුමාන කිරීම වැරදි සහගත නිගමනයකි.
- අනාරක්ෂිත ලිංගික සම්බන්ධතාවයන්හී යෙදෙන අය බාහිර වශයෙන් රෝග ලක්ෂණ නො පෙන්වුව ද ළඟම ඇති ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග පිළිබඳ සායනයට ගොස් පරීක්ෂා කරවා ගැනීම ඉතා වැදගත් වේ.

# ලිංගාශ්‍රිත රෝග සායන



- ලිංගාශ්‍රිත රෝග සායන සඳහා ඕනෑම පුද්ගලයකුට යාහැකි වන අතර ඒ සඳහා කිසිඳු යොමු කිරීමක් අවශ්‍ය නොවේ.
- මෙහි දී පුද්ගලයාගේ රහස්‍යභාවය ආරක්ෂා කරන අතර උපදෙස්, පරීක්ෂණ සහ උපදේශනය මෙන් ම අවශ්‍ය වූ විටක ප්‍රතිකාර ද නොමිලේ ලබා දෙනු ඇත.
- රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා මෙහි දී පුද්ගලයාගේ නම වෙනුවට අංකයක් භාවිත කිරීමක් සිදු කරයි.



NSACP

# ලිංගාශ්‍රිත රෝග සායන

රජයේ රෝහල් වලට අනුබද්ධව ඇති ලිංගාශ්‍රිත රෝග සායන වලට කිසිඳු යොමු කිරීමක් අවශ්‍ය නොවේ


HIV/AIDS ලිංගාශ්‍රිත රෝග සඳහා වලින් නොමිලේ හා රහසිගත ව ලබාගත හැකියිකිසිඳු යොමු කිරීමක් අවශ්‍ය නොවේ

**නොමිලේ**

- පරීක්ෂණ
- උපදෙස්
- උපදේශනය
- ප්‍රතිකාර

# ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග සායන පවත්වන රජයේ රෝහල් හා ඒවායේ දුරකථන අංක

| | |
|---|---|
| කොළඹ | 011-2667163 |
| බදුල්ල | 055-2276261 |
| කළුතර | 034-2236937 |
| රත්නපුර | 045-2225396 |
| මොණරාගල | 055-2276261 |
| ගාල්ල | 091-2245998 |
| හම්බන්තොට | 047-2220247 |
| මාතර | 041-2232302 |
| ඇඹිලිපිටිය | 0472230261 |
| කල්මුණේ | 0602229496 |
| බලපිටිය | 0912255447 |
| ගම්පහ | 0332222261 |
| නුවර එළිය | 052-2234393 |



# ලිංගාශ්‍රිත රෝග සායන

| | |
|---|---|
| යාපනය | 021-2222245 |
| වවුනියාව | 024-2224575 |
| මන්නාරම | 023-2232261 |
| ත්‍රිකුණාමලය | 026-2222261 |
| අනුරාධපුරය | 025-2222261 |
| පොළොන්නරුව | 027-2222384 |
| මඩකළපුව | 065-2222641 |
| කුරුණෑගල | 037-2224339 |
| හලාවත | 032-2220750 |
| මාතලේ | 066-2222261 |
| මහනුවර | 081-2203622 |
| කෑගල්ල | 035-2222261 |
| මීගමුව | 031-2224156 |
| රාගම | 011-2960224 |
| අම්පාර | 063-2222261 |



NSACP








# ස්තූතියි!